 සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | ඉතිහාසය I | කාලය : පැය 1 යි. |
|---|---|---|

### I පත්‍රය

■ ප්‍රශ්න 40 ට ම පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා කොටු කොළයේ සළකුණු කරන්න.

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති විදේශීය මූලාශ්‍රයක් නොවන්නේ කුමක්ද?
    1. ඩී මොන්ඩෝ 2. දිව්‍යාවධානය 3. ඉන්ඩිකා 4. පූජාවලිපුස්තක

02. මහා වංශයට ලියන ලද ටීකාව කුමක්ද?
    1. කථාවස්තුප්‍රකරණය 2. සහස්සවත්ථුප්‍රකරණය
    3. වංශත්ථප්‍රකාශිනී 4. සමන්තපාසාදිකාව

03. මෙරට මූලාශ්‍ර අතුරින් අභිලේඛන ගනයට නොවැටෙන්නේ කුමක්ද?
    1. තුඩපත් 2. මැටි පුවරු 3. සෙල්ලිපි 4. තඹපත්

04. මෙරට පැරණිතම සෙල්ලිපිවල ඇති අක්ෂර වර්ගය කුමක්ද?
    1. බ්‍රාහ්මී 2. ප්‍රාකෘත 3. සංස්කෘත 4. හෙළ අකුරු

05. ලංකාවේ විශාලතම සෙල් ලිපිය කුමක්ද?
    1. වේවැල්කැටිය ලිපිය 2. කළුදිය පොකුණ ලිපිය
    3. පනාකඩුව තඹ සන්නස 4. ගල්පොත ලිපිය

06. වල්ලිපුරම් තඹ සන්නස කුමන රජුට අයත් ද?
    1. I විජයබාහු රජු 2. I ගජබාහු රජු 3. IV වන මිහිඳු රජු 4. වසභ රජු

07. කාසි මූලාශ්‍රයක් ලෙස භාවිත කිරීමේදී වඩාත් වැදගත් ප්‍රයෝජනයක් වන්නේ කුමක්ද?
    1. වෙළඳාම පිළිබඳ තොරතුරු 2. ලෝහ පිළිබඳ තොරතුරු
    3. විදේශ රටවල් පිළිබඳ තොරතුරු 4. තානාපති තොරතුරු

08. ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,
    1. ජාතික ව්‍යාපාර වර්ධනය වීම 2. අන්‍යමත ඛණ්ඩනය කිරීම
    3. රටේ අනන්‍යතාව හඳුනාගැනීම 4. ලෝකය වෙනස් කිරීම

09. ලංකාවට පැමිණි ලන්දේසි දේවගැතියා කවුද?
    1. ක්වේරෝස් 2. පිලිප් බැල්දියෙස්
    3. ප්ලිනි 4. රිබෙයිරෝ

10. පර්නාවෝ ඩී ක්වේරෝස් කුමන ජාතිකයෙක්ද?
   1. චීන   2. ලන්දේසි   3. පෘතුගීසි   4. රෝම

11. මෙරට ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ පැරණිතම සාක්ෂි හමුවන ස්ථාන වන්නේ,
   1. කඳුකර නිම්නවල   2. පාහියංගල
   3. මැණික් පතල්   4. බෙල්ලන්බැඳි පැලැස්ස

12. පහත සඳහන් ස්ථාන අතුරින් ප්‍රාග්ද ඓතිහාසික ස්ථානයක් නොවන්නේ කුමක්ද?
   1. බුන්දල   2. අලිගල   3. රාවණා ඇල්ල   4. දුම්මලසූරිය

13. ශ්‍රී ලංකාව බෙදා ඇති පරිසර කලාප ගණන කීයද?
   1. 4 කි.   2. 5 කි.   3. 6 කි.   4. 8 කි.

14. පූර්ව රාජ සමය වන විට පරුමකවරුන්ට ප්‍රාදේශීය බලයක් තිබුණු බවට තොරතුරු දක්වෙන සෙල්ලිපිය කුමක්ද?
   1. කොත්ගල්කන්ද ලිපිය   2. වාදුරුප්ප ලිපිය
   3. පෙරිය පුලියන්කුලම ලිපිය   4. යටහලෙන ලිපිය

15. ''රජු'' යන්නට මුල් ඓතිහාසික යුගයේදී ඇති අර්ථය කුමක්ද?
   1. බ්‍රහ්මගේ නියෝජිතයා   2. දෙවියන්ගේ නියෝජිතයා
   3. මහාභාරතවරයා   4. සතුටු කරන්නා

16. ක්‍රි.පූ. පළමු සියවස වන විට ගමෙහි ප්‍රධානියා හඳුන්වා ඇත්තේ,
   1. රජු   2. ගම්පති   3. ගමික   4. පරුමක

17. මෙරට ලෙන්වාසස්ථානයක් නොවන්නේ කුමක්ද?
   1. පොතාන   2. කිතුල්ගල   3. හෝර්ටන් තැන්න.   4. පාහියංගල

18. අවධි කිහිපයකටම අයත් ඇටසැකිලි හමු වී ඇති ස්ථානය,
   1. කිතුල්ගල   2. ඉරණමඩු සැකැස්ම   3. රජගල   4. පාහියංගල

19. ගොලුබෙල්ලන් මහත් රුචියකින් ආහාරයට ගත් යුගය කුමක්ද?
   1. පූර්ව ඓතිහාසික යුගය   2. ප්‍රාග් ඓතිහාසික යුගයේදි
   3. ඓතිහාසික යුගය   4. යකඩ යුගයේදී

20. 'ඉබ්බන්කටුව කැණීම් භූමියේ කාක්ෂි හමුවන කාලවකවානුව නම්,
   1. ප්‍රාග් ඓතිහාසික යුගය   2. පූර්ව ඓතිහාසික යුගය
   3. ගොවි යුගයේදී   4. දඩයම් යුගයේ දි

21. සෙල්ලිපිවල 'සභාව' නුවෙන් අදහස් කර ඇත්තේ,
   1. රාජ සභාව   2. ව්‍යවස්ථාදායකය   3. අධිකරණය   4. විධායකය

22. වසභ රජු පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1. මහවැව් ඉදිකිරීම ආරම්භ කළ රජු
    2. ලම්භකර්ණ වංශයේ ප්‍රථම රජු
    3. පළාත් පාලනය විධිමත්ව පවත්වාගෙන ගිය රජු
    4. දහස්තොටදී උපසම්පදාවක් කළ රජු

23. අතීතයේ ධීවරයන් සිටි ගම්මාන හැඳින්වූයේ,
    1. කුම්භකාරගම
    2. ඔලගම
    3. කේවට්ටගම
    4. බඩ්ඩකීගාම

24. එල්ලංගාවක් යනු කුමක්ද?
    1. අත්හරින ලද ගම
    2. අංගමැඩිල්ල
    3. වැව් බැම්ම
    4. වැව් පද්ධතිය

25. තොටුපල භාරව සිටිමින් බදු එකතුකළ තැනැත්තා
    1. තොටියා
    2. පටුන්ග්‍රාම
    3. තොටබොජක
    4. ගමික

26. ඓතිහාසික යුගයේදී ජනාවාස නිර්මානය වුයේ,
    1. ගංගා නිම්නවලින් පිටත ය.
    2. ගංගාවල පහල නිම්නවල ය.
    3. ගංගා දෙකක් අතරයි
    4. වැව් ආශ්‍රය කරගෙනයි.

27. අතීතයේදි නුරුපුර ලෙස හඳුන්වා ඇත්තේ,
    1. මහනුවර
    2. අනුරාධපුර
    3. පොළොන්නරුව
    4. මාසම

28. පහත සඳහන් රජවරුන් හා ඔවුන්ගේ කාර්යයන් නිවැරදිව ගැලපූ විට ලැබෙන සංයෝගය කුමක්ද?

| | |
|---|---|
| වසභ රජු | A. දිවයින එක්සත් කිරීම |
| නිශ්ශංකමල්ල රජු | B. මහවැව් තැනවීම |
| මහාවිජයබාහු රජු | C. ගල්පොත ලිපිය කරවීම |

    1. BCA
    2. CAB
    3. ACB
    4. CAB

- පහත සිදුවීම් ඇසුරින් 29 හා 30 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    A. ගමෙහි ගැටළු විසඳීම
    B. පියංගුතිස්ස විහාරය කරවීම
    C. ගම්වැව් වල ජල කලමනාකරණය කිරීම
    D. නව රාජ වංශයක් ආරම්භ කිරීම
    E. ලක්දිව වැඩිම සෙල්ලිපි ප්‍රමාණයක් කරවීම

29. ගමික විසින් කරන ලද කාර්යයන් පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?
    1. DA
    2. BE
    3. AC
    4. CB

30. වසභ රජු පමණක් අදාළ වන්නේ,
    1. BD
    2. AC
    3. CA
    4. DA

31. පහත දක්වෙන කාර්යයන් අතුරින් පණ්ඩුකාභය රජුට පමණක් අදාළ තොරතුරු පමණක් ඇතුළත් වන්නේ,
    A. මහමෙව්නා උයන තැනවීම
    B. අනුරාධපුර නගරය ඉදිකිරීම
    C. ලක්දිව වැඩිම කාලයක් රජ කිරීම
    D. විදේශිය ආධිපත්‍යයෙන් රට බේරා ගැනීම
    E. ලක්දිව වැඩිම සෙල්ලිපි ප්‍රමාණයක් කරවීම

1. BD 2. BA 3. DB 4. BC

32. බුදල්නාව හෙවත් ගම්වරක් ලබාදුන් බවට තොරතුරු ඇත්තේ,
   1. යටහලෙන 2. අඹගමුව ලේඛනය
   3. කළුදිය පොකුණ ලිපිය 4. කොත්ගල් කන්ද ලිපිය

- පහත වගුවේ A සිට J දක්වා තොරතුරු ඇසුරින් 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | ආණ්ඩුකාරවරු | ඓතිහාසික පුද්ගලයෝ |
|---|---|---|
| A 1765 | රොබට් බ්‍රවුන්රිග් | ජෝන් ඩොයිලි |
| B. 1803 | පෙඩ්රික් නෝර්ත් | මැක්ඩෝවල් |
| C. 1818 | ෆන් එංගල් බෙක් | පස්වන විලියම් |

33. මෙරට ලන්දේසි බලකොටු ඉංග්‍රීසීන්ට පවරා ගැනීමට අදාළ තොරතුරු ඇතුලත් පිළිතුර කුමක්ද?
   1. B D G 2. A F J 3. B D J 4. C E H.

34. ඉංග්‍රීසි උඩරට අල්ලා ගැනීමට අදාළ සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක්ද?
   1. B E H 2. A D H 3. A F G 4. B D G

35. සෙල්ලිපිවල වටාපොත මගින් පෙන්නුම් කරන්නේ,
   1. දිමනා 2. සෙංකෝලය 3. රාජකීයත්වය 4. පාරිශුද්ධ බව

36. විශේෂ උණ රෝහලක් ඉදිකළ රජු කවුද?
   1. බුද්ධදාස රජු 2. අග්ගබෝධි රජු
   3. හතරවන මිහිඳු රජු 4. හතරවන කාශ්‍යප රජු

37. කාලිංග බිසවක් විවාහ කරගත් රජරට ශිෂ්ටාචාරයේ රජු කවුද ?
   1. මානවම්ම රජු 2. ගෝඨාභය රජු 3. I විජයබාහු රජු 4. නිශ්ශංකමල්ල රජු

38. ''හේන්'' සඳහා උම්මග්ග ජාතකයේ යොදා ඇති නාමය,
   1. සෙංහන් 2. පිටබිම් 3. සේන් 4. කනත්ත

39. හේන් ගොවිතැනේදී අයකළ බද්දක් වන්නේ,
   1. කැතිඅඩ 2. පිසඹුරුවත 3. මතෙරමජිබක 4. දකබක

40. ස්වභාවික මියගිය කුකුලන්ගේ හා එළුවන්ගේ මාංශ රෝහල්වල රෝගීන්ගේ ආහාර සඳහා යොදා ගත යුතු බවට තොරතුරු ඇතුලත් සෙල්ලිපිය කුමක්ද?
   1. වේගිරිය ලිපිය 2. කොණ්ඩවට්ටවාන් ලිපිය
   3. මැදිරිගිරිය පඨානගර ආසන ලිපිය 4. සොරබොර ලිපිය

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | ඉතිහාසය II | කාලය : පැය 1 යි. |
|---|---|---|

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරක් හා III කොටසින් එක් ප්‍රශ්නයක් වන සේ පිළිතුරු සපයන්න.
- ප්‍රථම ප්‍රශ්නය හා II හා III කොටසේ ප්‍රශ්න සමග මුළු ප්‍රශ්න පහක් වන සේ පිළිතුරු සැපයිය යුතුයි.

## I කොටස

01. අ. පහත (i) හා (ii) කොටස්වල ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ඔබට සපයා ඇති ලංකාවේ හා ලෝක සිතියම මත සලකුණු කර නම් කරන්න.

i. දඹකොළ පටුන, බූන්දල, පොළොන්නරුව, මල්වතු ඔය, අලිගල, සීතාවක, කෝට්ටේ, මහියංගනය, කුරුණෑගල, කොට්ටියාරම, හුරුළු වැව, මඩකලපුව, (ල. 12)

ii. කැලිකට්, රතු මුහුද, කොන්ස්තන්තිනෝපල්, කළු මුහුද, ජාවා, ජපන් දූපත් (ල. 6)

ආ. i. පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ රජු නම් කරන්න.

A. අනුරාධපුර අගනගරය කරගත් ප්‍රථම පාලකයා


B. නරඉසෙර ලෙස සෙල්ලිපිවල සඳහන් රජතුමා

C. පොළොන්නරුව අගනගරය කරගත් පළමු සිංහල රජු

D. පළමුවන විජයබාහු රජු කුඩාකළ උදව්කළ ප්‍රාදේශීය නායකයා (ල.4)

- පහත A හා B යටතේ දී ඇති පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A රූපය



ii. 1. මෙය කුමක්ද?

2. මෙය පිහිටා ඇත්තේ කොහේද?

3. මෙය පිහිටවූ රජු කවුද?

4. එම රජුගේ වංශය කුමක්ද?

B රූපය



iii. 1. මෙහි සිටින්නේ කවුද?

2. මෙය පිහිටා ඇත්තේ කොහේද?

3. මෙතුමා රජකළ ස්ථානය කුමක්ද?

4. මෙතුමා ගනුදෙනු කළ බටහිර රට කුමක්ද?

## II කොටස

02. i. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති වංශකථා තුනක් ලියන්න. (ල. 3 යි)

ii. මෙරට ඉතිහාසය හදාරන සෙල්ලිපි 4 ක් ලියන්න. (ල.4 යි)

iii. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඉිහාසය ඉගෙනීමේදී වැදගත්වන අයුරු උදාහරණ දෙකකින් විස්තර කරන්න. (ල. 5 යි)

iv. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන කරුණු තුනකින් පහදන්න. (ල. 6 යි)

03. i. රජවරුන් විසින් පහත රාජ්‍යත්ව සංකල්ප ආරෝපනය කරගත් අතර එම රජවරු නම් කරන්න.

A. දේවත්ව B. පර්වත රාජ C. චක්‍රවර්තී (ල. 3 යි)

ii. පහත රාජ්‍ය නිලධාරීන් අනුපිළිවෙළින් ලියන්න.

A. මහමක B. බතගු

C. නගර ගුතික D. තොරතුරු ගැනා (ල. 4 යි)

iii. දුටුගැමුණු රජුගේ වැදගත්කම කරුණු දෙකකින් පහදන්න. (ල. 5 යි)

iv. අතීතයේ තිබූ ප්‍රාදේශීය පාලනය පිළිබඳ කරුණු තුනක් යටතේ විස්තර කරන්න. (ල. 6 යි)

04. i. පහත සඳහන් වැව් කරවූ රජවරු පිළිවෙළින් ලියන්න.

A. කවුඩුළු වැව B. කලා වැව C. තිසා වැව (ල. 3 යි)

ii. වැවක ඇති ප්‍රධාන අංග හතරක් නම් කරන්න. (ල. 4 යි)

iii. වැවක් තැනවීමේදී වාරි ඉංජිනේරුවන් සලකා බැලූ තාක්ෂණික කරුනු දෙකක් විස්තර කරන්න. (ල. 5 යි)

iv. මෙරට වාරිකර්මාන්තය විනාශ වී යාමට හේතු තුනක් විස්තර කරන්න. (ල. 6 යි)

05. i. ප්‍රාග් ඓතිහාසික යුගයේ තිබූ වාසස්ථාන අතුරින් එළිමහන් වාසස්ථාන 3 ක් ලියන්න. (ල. 3 යි)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර සඳහා භාවිතා කළ සතුන් වර්ග හතරක් ලියන්න. (ල. 4 යි)

iii. ප්‍රාග් ඓතිඵාසික ජනාවාසවල මූලික ලක්‍ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ල. 5 යි)

iv. ප්‍රාග් ඓතිහාසික ජනතාවගේ අභිචාර විධි පිළිබඳව විස්තර කරන්න. (ල. 6 යි)

06. i. පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස හමු වී ඇති ස්ථාන තුනක් ලියන්න. (ල. 3 යි)

ii. ප්‍රාග් ඓතිහාසික යුගය හා පූර්ව ඓතිහාසික යුගය වෙන්කර හඳුනාගත හැකි කරුණු හතරක් ලියන්න. (ල. 4 යි)

iii. පූර්ව ඓතිහාසික යුගයේ සුසාන භූමිවල විශේෂ ලක්‍ෂණ දෙකක් විස්තර කරන්න. (ල. 5 යි)

iv. මුල් ඓතිහාසික ජනාවාස ව්‍යාප්තියට බලපෑ හේතු තුනක් විස්තර කරන්න. (ල. 6 යි)

07. i. පහත දැක්වෙන මුල් ඓතිහාසික ගම්මාන පිළිවෙළින් දක්වා ඇති අතර ඒවායේ සිටි වෘත්තිකයන් හඳුන්වන්න.

A. කුම්භකාරගාම B. ගෝපාලගම C. වඩ්ඪකීගාම (ල. 3 යි)

ii. පහත සඳහන් තනතුරු නාම හඳුන්වන්න.

A. ගමික B. ගහපති

C. පරුමක D. තොට බොජක (ල. 4 යි)

iii. පරුමකගේ කාර්යභාරය කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ල. 5 යි)

iv. එල්ලංගාවක් මගින් කෙරෙන කාර්යයන් කරුණු තුනකින් විස්තර කරන්න. (ල. 6 යි)

08. i. පහත රජවරුන් හා බැඳුනු කරුණුවලට අදාළ රජුගේ නාමය ලියන්න.

A. මෙරට මහවැව් තැනවීමේ ආරම්භක රජු

B. බුදුදහම මෙරට ගෙන ඒමට අනුග්‍රහය දැක් වු ඉන්දියානු අධිරාජ්‍යයා

C. යාපනයේ පියංගුතිස්ස විහාරය කළ ඇමතිවරයා (ල. 3 යි)

ii. 'සභාව' හා 'එක්තැන් සමිය' යනුවෙන් හැඳින්වුයේ කුමක් සඳහා ද? (ල. 4 යි)

iii. මෙරට සෞඛ්‍ය සුභසාධනයට උදව් කර ඇති රජවරුන්ගේ කාර්යයන් දෙකක් පහදන්න.ල. 5 යි)

iv. හේන් ගොවිතැනේදී අතීතයේ හේන්වගා කළ අයුරු උදාහරණ තුනකින් පැහැදිලි කරන්න. (ල. 6 යි.)

## III කොටස

09.. i. රජරට සමයේ ලංකාවට පැමිණි විදේශ ආක්‍රමණ තුනක් ලියන්න. (ල. 3 යි)

ii. අනුරාධපුර පාලන නගරයක් බවට පත්කිරීමේදී පණ්ඩුකාභය රජු කළ සේවාවන් දෙකක් ලියන්න. (ල.4 යි)

iii. දේවානම්පියතිස්ස රජුගේ සේවාවන් කෙටියෙන් පහදන්න. (ල. 5 යි)

iv. බුදුදහම මෙරටට ලැබීම නිසා ඇති වූ වෙනස්කම් පිළිබඳව කරුණු තුනකින් පැහැදිලි කරන්න. (ල. 6 යි)

10 i. ලංකාවේ පැරණි වෙළඳ නීති පිළිබඳ'ව ලියවී ඇති සෙල්ලිපියක් හාඑහි ඇති වෙළඳ නීති දෙකක් ද ලියන්න. (ල. 3 යි)

ii. අතීත ලංකාවේ විදේශ වෙළඳාම් සිදුකර ඇති රටවල් හතරක් ලියන්න. (ල.4 යි)

iii. විදේශ වෙළඳාම තුළ ආනයනය කළ භාණ්ඩ පිළිබඳව විස්තරයක් කරන්න. (ල. 5 යි)

iv. ඉන්දියානු සාගරයේ නැගෙනහිර වරාය භාවිත කරමින් මෙරට වෙළඳාම දියුණු වු ආකාරය කරුණු තුනකින් පහදන්න (ල. 6 යි)